**<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරුවලට පත් කිරීමේ</u>**

**<u>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ පරිපාටිය</u>**

**1. ජ්‍යෙෂ්ඨතාවය** **උපරිම ලකුණු 30**

(ශ්‍රී ලං.අ.ප.සේ. 1 ශ්‍රේණියට උසස් වූ දින සිට එක් වසරකට ලකුණු 03 බැගින්)

**2. අධ්‍යාපන සුදුසුකම්** **උපරිම ලකුණු 15**

2.1 පශ්චාත් උපාධිය - ලකුණු 10
2.2 පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 05

(කාර්යක්ෂමතා කඩඉම්වලින් නිදහස් කිරීමට සලකා බලන ලද සුදුසුකම් හැර වෙනත් අධ්‍යාපන සුදුසුකම් පමණක් ඉහත ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලැබේ. 2.1 සහ 2.2 අවස්ථා වලදී උපරිම සහතික / සුදුසුකම් 2ක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

**3. ක්ෂේත්‍රයෙහි සේවා පළපුරුද්ද** **උපරිම ලකුණු 20**

(අදාළ පත්වීම් බලධාරීන් විසින් නිකුත් කර ඇති විධිමත් පත්වීම් ලිපි සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)

3.1 විදුහල්පති (ශ්‍රී ලං.අ.ප.සේ. 1 ශ්‍රේණියේ නිලධාරියෙකු විදුහල්පති තනතුරක් දැරිය යුතු පාසලක , එක් වසරක සේවා කාලයකට ලකුණු 04 බැගින් උපරිම වසර 05ක් සඳහා)

3.2 නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ / නියෝජ්‍ය කොමසාරිස් / විදුහල්පති
(ශ්‍රී ලං.අ.ප.සේ.11/111 ශ්‍රේණියේ නිලධාරියෙකු විදුහල්පති තනතුරක් දැරිය යුතු පාසලක )
(එක් වසරක සේවා කාලයක් සඳහා ලකුණු 2.5 බැගින් උපරිම වසර 08ක් සඳහා)

3.3 නියෝජ්‍ය විදුහල්පති
(එක් වසරක සේවා කාලයක් සඳහා ලකුණු 02 බැගින් උපරිම වසර 10ක් සඳහා)

3.4 සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ / සහකාර කොමසාරිස්
(එක් වසරක සේවා කාලයක් සඳහා ලකුණු 01 බැගින්)

**4. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම** **උපරිම ලකුණු 05**

**(ප්‍රායෝගික භාවිතය පිළිබඳව සළකා බලනු ලැබේ)**

**5. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය** **උපරිම ලකුණු 05**

**(සන්නිවේදන කුසලතාවය සළකා බලනු ලැබේ)**

**6. අධ්‍යාපනයට අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන** **උපරිම ලකුණු 05**

6.1 පර්යේෂණ - ලකුණු 2.5 × 2

(පශ්චාත් උපාධියට / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ / නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ)

6.2 ප්‍රකාශන - ලකුණු 2.5 × 2

(පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර, අධ්‍යාපන ග්‍රන්ථ **ප්‍රකාශන උපදේශන මණ්ඩලය මඟින් අනුමතිය ලද ප්‍රකාශන පමණක්** ලකුණු ලබා දීමේදී සළකා බලනු ලැබේ.)

6.3 අධ්‍යාපන ප්‍රකාශන සඳහා ලබා දෙන ලද වාර්තා හා ශාස්ත්‍රීය සංග්‍රහ සඳහා - ලකුණු 2 × 1

**(උපරිම පර්යේෂණ හා ප්‍රකාශන දෙකක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)**

**7. ඉදිරිපත් කිරීම** **උපරිම ලකුණු 10**

ඔබගේ ආයතනයේ , (පාසල / අධ්‍යාපන අමාත්‍යාංශය/ අධ්‍යාපන දෙපාර්තමේන්තුව/ කලාප කාර්යාලය/ කොට්ඨාස කාර්යාලය) ඔබ විසින් රාජකාරි ඉටු කිරිමේදී , අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා මූලික වූ සිද්ධියක් පදනම් කරගෙන එය විශ්ලේෂණය කරමින් කරනු ලබන ඉදිරිපත් කිරිමක් සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

I. **ප්‍රවේශය හා හැඳින්වීම - ලකුණු 2**
II. **අන්තර්ගතය - ලකුණු 2**
III. **කාල කලමනාකරණය - ලකුණු 2**
IV. **ඉදිරිපත් කිරීමේ විලාශය - ලකුණු 2**
V. **නිමාව හා නිගමනය - ලකුණු 2**

ඒ සඳහා පරිගණක ආශ්‍රයෙන් (PowerPoint) හෝ වෙනත් සුදුසු මාධ්‍යයකින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු අතර ඔබ ඉදිරිපත් කරනු ලබන සිද්ධි අධ්‍යයනයට අදාළ දෘඨ පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දිය යුතු වේ.

**9. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබූ සමස්ථ කුසලතාව** **උපරිම ලකුණු 10**

**100**